# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 78 දරන
# මුදල් සමාගම් පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය**

**මිළ : රු. 3.30 යි.** තැපැල් ගාස්තුව : රු. 2.30 යි.

# 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 56/88

**මුදල් සමාගම් පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව— මේ පනත යටතේ මුදල් සමාගම් ලියාපදිංචි කිරීම.

(අ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ; සහ

(ආ) රුපියල් මිලියන පහකට නොඅඩු නිකුත් කරනු ලැබ ඇත්තා වූ සහ ගෙවනු ලැබ ඇත්තා වූ අවම ප්‍රාග්ධනයක් ඇත්තා වූ; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ

පොදු සමාගමක් විසින් හැර මුදල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(2) සමාගමක් විසින් මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක් ම, නියමිත ආකෘතිය අනුව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර ඉල්ලුම්කරුගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට ඉල්ලුම්කරු විසින් කළ ප්‍රකාශයක් එහි ඇතුළත් විය යුතු ය.

(3) යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් අසත්‍ය බව දැනගෙනම (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රකාශයක් කරන හෝ යම් තොරතුරක් සපයන සෑම තැනැත්තෙකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

2—ඩී 002352—7,900 (89/01)

(4) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, මණ්ඩලය විසින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන සමාගමේ පොත්, වාර්තා සහ ලේඛන කැඳවා පරීක්ෂා කරනු ලැබිය හැකි ය. නැතහොත් පරීක්ෂා කිරීමට සලස්වනු ලැබිය හැකි ය.

(5) පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා සමාගමක් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් සැලකිල්ලට ගනු ලැබූ විට—

(i) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නියමයන් අනුව කටයුතු කර ඇති බවට ; සහ

(ii) සමාගම ලියාපදිංචි කරනු ලැබීම තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ සම්බන්ධතාවලට හානිකර නොවන බවට මණ්ඩලය වෙත සපයනු ලැබූ තොරතුරු මත

මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, මණ්ඩලය විසින් ඒ සමාගම මුදල් සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(6) සමාගමක් (5) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ නොමැති අවස්ථාවක හෝ 3 වන වගන්තිය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද නැතහොත් පුද්ගල මණ්ඩලයකට ද ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් ඒ වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමට පැහැර හැර ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ සමාගම, තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් කර ගෙන යනු ලබන මුදල් ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම සඳහා හෝ එය අවසන් කිරීම සඳහා සහ ඒ සමාගමේ, තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ තැන්පතු බැරකම් බේරුම් කිරීම සඳහා වූ විධාන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. තවද, ඒ විධාන අනුව කටයුතු කිරීම ඒ සමාගමේ, තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධාන අනුව කටයුතු කිරීම ඒ විධාන නිකුත් කරනු ලැබීමේ සිට එක් මාස යක් ඇතුළත සමාගමක්, තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පැවරීම ඇතුළු ව ඒ අනුව කටයුතු කිරීම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවකදී 18 වන වගන් තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

3\. (1) 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ආරම්භ වන දිනයට ඉහතින් ම වූ දිනයෙහි මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන ගිය සමාගමක් හෝ පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින්— මේ පනත යටතේ ලියාපදිංචි නොවූ තැනැත්තන් විසින් හෝ පුද්ගල මණ්ඩල විසින් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙනයාම සම්බන්ධයෙන් අන්තර් කාලීන විධිවිධාන.

(අ) එය 2 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබුව ද, මේ පනත ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ඒ ව්‍යාපාර කටයුතු නොකඩව කර ගෙන යනු **ලැබිය හැකි ය ;**

(ආ) 2 (1) වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමට අවශ්‍ය යම් පියවර ගත යුතු අතර මේ පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ට) ඡේදය යටතේ නිකුත් කරන ලද යම් විධානයක් කඩ කරමින් කර ගෙන යනු ලබන කටයුතු කිසිවක් මේ පනත ආරම්භ වීමේ දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් හෝ ඒ විධානය නිකුත් කිරීමේ දින සිට මාස හතර යන දෙකින් කවර හෝ පසුව එළඹෙන කාලසීමාව ඇතුළත ඒ සමාගම හෝ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින් වැළකී සිටිනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සෑම සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කරනු ලැබූ විට ඒ කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔප්පු කිරීමෙහිලා සාක්ෂි මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. මණ්ඩලය සෑහීමට පත් වන ආකාරයෙන් ඒ විධිවිධාන අනුව කටයුතු කරන සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් 2 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය.

(3) සමාගමක් හෝ තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් (1) වන උපවගන්තිය යටතේ මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යනු ලබන අවස්ථාවක, ඒ සමාගමට, තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු තාක් දුරට සහ මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව අදාළ විය යුතු ය.

4\. (1) මුදල් සමාගමක් විසින් රුපියල් මිලියන පහක අඩු නොකළ ප්‍රාග්ධනයක් සියලු අවස්ථාවලදී පවත්වා ගෙන යා යුතු ය. මුදල් සමාගම් විසින් අඩු නොකළ ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යා යුතු බව.

(2) මණ්ඩලයේ කලින් ලබාගත් ලිඛිත අනුමතය නොමැතිව මුදල් සමාගමක් විසින් එහි ප්‍රාග්ධන හෝ ව්‍යවස්ථාපිත සංචිත හීන කිරීමක් හෝ අඩු කිරීමක් හෝ නොකළ යුතු ය. මේ උපවගන්ති

යෙහි " ව්‍යවස්ථාපිත සංචිත " යන්නෙන් මේ පනතේ සමාගම වෙත නිකුත් කරන ලද විධානයක් අනුව සමාගම විසින් පවත්වා ගෙන යනු ලබන යම් සංචිත අරමුදලක් අදහස් වේ.

මුදල් සමාගම් විසින් ව්‍යාපාර කටයුතු පවත් වා ගෙන යාම.

**5.** මුදල් සමාගමක් විසින්, එහි තැන්පතු ආරක්ෂා වන ආකාර යෙන් ස්වකීය ව්‍යාපාර කටයුතු සියලු අවස්ථාවලදී පවත්වා ගෙන යා යුතු අතර, තැන්පතුකරුවන්ට ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු මත පොලිය නියමිත දින ගෙවන බවට සුරක්ෂිත කිරීමට යුක්තිසහගත ලෙස අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

මුදල් සමාගම් පිළිබඳ ලේඛනය.

**6.** මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම මුදල් සමාගමක් සම්බන්ධයෙන්ම නියමිත ආකෘතිය අනුව ලේඛනයක් මණ්ඩලය විසින් තබා ගත යුතු අතර, එය පවත්වා ගෙන යා යුතු ය.

මුදල් සමාගමට බලපත්‍රයක් නිකුත් කිරීම.

**7.** (1) මේ පනත යටතේ මුදල් සමාගමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඒ මුදල් සමාගමට අවසර දෙමින් නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් මණ්ඩලය විසින් ඒ මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ බලපත්‍රය මුදල් සමාගමේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ ව්‍යාපාර ස්ථානයෙහි සියලු අවස්ථාවලදී ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම මුදල් සමාගමක්ම නියමිත මුදල් ප්‍රමාණයකින් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් මණ්ඩලයට ගෙවිය යුතු ය.

මුදල් ව්‍යාපාර කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට දැන් වීම මුදල් සමාගමේ යුතුකම බව.

**8.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ මුදල් සමාගමක් විසින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සමාගම විසින් එසේ අවසන් කරනු ලැබූ විට, මණ්ඩලය වෙත ඒ අවසන් කිරීම සම්බන්ධයෙන් දැන්වීමක් නොපමාව දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවසන් කිරීම සම්බන්ධයෙන් දැන්වීම ලැබුණු විට 6 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙන් මුදල් සමාගමේ නම මණ්ඩලය විසින් ඉවත් කළ යුතු අතර, එහි බලපත්‍රය අවලංගු කළ යුතු ය. තව ද, මුදල් සමාගමේ මුදල් ව්‍යාපාර කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා හෝ අවසතු කිරීම සඳහා සහ මුදල් සමාගමේ තැන්පතු බැරකම් සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් ආකාරයකින් බේරුම් කිරීම සඳහා විධාන ඒ මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුදල් සමාගමක් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන නොයන බව විශ්වාස කිරීමට මණ්ඩලයට යුක්ති සහගත හේතු ඇති අවස්ථාවක, ඒ සමාගම විසින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන යාම අවසන් කර නොමැති බව මණ්ඩලයේ දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත ඔප්පු කරන ලෙස ඒ සමාගමට නියම කරමින් මණ්ඩලය විසින් ඒ සමාගමට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවිය හැකි ය. ඒ කාල සීමාව ඇතුළත එය ඔප්පු කිරීම ඒ මුදල් සමාගම විසින් පැහැර හරින අවස්ථාවක, මණ්ඩලය විසින් 6 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙන් ඒ මුදල් සමාගමේ නම ඉවත් කොට එහි බලපත්‍රය අවලංගු කළ යුතු ය. මුදල් සමාගමක ලියාපදිංචිය එසේ අවලංගු කර ඇති අවස්ථාවක, ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ඇතුළු අවශ්‍ය යයි සලකනු ලබන යම් විධාන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. නැතහොත් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කිරීමට අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර එවැනි අවස්ථාවක දී 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) මණ්ඩලය විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අනුව කටයුතු කිරීමට මුදල් සමාගමක් පැහැර හරින අවස්ථාවක, එම විධිවිධාන නිකුත් කළ දින සිට මාසයක් ඇතුළත මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පැවරීමට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කළ හැකි අතර ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

9. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද මණ්ඩලය විසින් මුදල් සමාගම්වල ව්‍යාපාර කටයුතුවල යම් අංගයක් පවත්වා ගෙන යාම සහ විශේෂයෙන් ම පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් යම් සණ්ඩායමකට හෝ වර්ගයකට අයත් මුදල් සමාගම්වලට විධාන දෙනු ලැබිය හැකි ය :— මණ්ඩලය විසින් විධාන දීම.

(අ) ඒ සමාගම් විසින් තැන්පතු භාර ගනු ලැබිය හැකි නියමයන් සහ කොන්දේසි, ඒ තැන්පතු මත ගෙවිය යුතු උපරිම පොලී අනුප්‍රමාණ සහ තැන්පතු භාර ගනු ලැබිය හැකි උපරිම කාලසීමාවන් එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් ගණනක එක් තැනැත්තකුගේ නමින් සමාගමක් වෙත තැන්පත් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය ;

(ආ) ඒ සමාගම් විසින් යම් ණයයක්, ණය පහසුවක් හෝ යම් වර්ගයකට අයත් මූල්‍ය පිළිසරණක් ප්‍රදානය කරනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන් සහ කොන්දේසි, ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පිළිසරණ මත අය කරනු ලැබිය හැකි උපරිම පොලී අනුප්‍රමාණයක් සහ ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පිළිසරණ ප්‍රදානය කරනු ලැබිය හැකි උපරිම කාලසීමාව ;

(ඇ) කොමිස් මුදල්, වට්ටම්, ගාස්තු හෝ වෙනත් ලැබීම් නැත හොත් කවර වූ ගෙවීම් ආකාරයෙන් ඒ සමාගම්වලට ගෙවනු ලබන නැතහොත් ඒ සමාගම් විසින් අය කරනු ලබන උපරිම අනුප්‍රමාණයක් ;

(ඈ) යම් කුලී සින්නක්කර ගිවිසුමක් මත ශක්‍ය කුලියට ගන්නකු විසින් කරනු ලැබිය යුතු අවම මූලික ගෙවීම සහ විවිධ ගණු දෙනු පංති සඳහා වූ නිශ්චිත විවිධ මූලික ගෙවීම් ; ඒ උපරිම මූලික ගෙවීම ඒ ගිවිසුම යටතේ කුලියට ගනු ලැබූ බඩුවල වටිනාකම ප්‍රතිශතයන් වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය ;

(ඉ) ඒ සමාගම් විසින් ආයෝජනය කරනු ලැබිය හැක්කේ යම් නියමවලට සහ කොන්දේසිවලට යටත්වද ඒ නියම හා කොන්දේසි ;

(ඊ) ඒ සමාගම් විසින් දෙනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පිළිසරණක් සහ කරනු ලබන ආයෝජන සඳහා අවසර දෙනු ලැබිය හැකි කල් පිරීමේ උපරිම කාලසීමාව ; සහ විවිධාකාර වර්ගවලට අයත් ණය දීම් ණය සහ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා නියම කරනු ලබන හෝ අවසර දෙනු ලබන ඇපවල ස්වභාවය සහ මුදල් ප්‍රමාණය ;

(උ) ඒ සමාගම් විසින් ගිණුම් පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යා යුතු ආකෘතිය සහ ආකාරය ;

(ඌ) ප්‍රදානය කරනු ලැබූ ණය අයකර ගනු ලැබිය නොහැකි බවට පත්ව ඇතොත් ඒ ණය සම්බන්ධයෙන් නොගෙවන ලද පොලිය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සමාගමේ ආදායමෙන් බැහැර කිරීම ;

(එ) ඒ සමාගම්වල ද්‍රවශීල වත්කම් සහ ඒ සමාගම්වල සම්පූර්ණ තැන්පතු බැරකම් අතර විය යුතු අවම අනුපාතය ;

(ඒ) මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් මුදල් සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග මුදල් ශේෂ පවත්වාගෙන යාම සහ ඒ මුදල් ශේෂ සහ මුදල් සමාගම්වල තැන්පතු බැරකම් අතර විය යුතු අවම අනුපාතය ;

(ඔ) තැන්පත්කරුවන් විසින් කල් පිරීමට පෙර තැන්පතු ආපසු ගැනීමට අදාළ විය යුතු කොන්දේසි ;

(ඕ) තම ණය, ණය පහසුකම් හෝ වෙනත් මූල්‍ය පිළිසරණ හෝ ආයෝජනවල මුදල් ප්‍රමාණය වැඩි කිරීමෙන් ඒ සමාගම් තහනම් කිරීම ;

(ක) මුදල් සමාගම් විසින් කරනු ලබන හෝ දෙනු ලබන යම් ණය, ආයෝජන හෝ මූල්‍ය පිළිසරණවල අනුප්‍රමාණය නිශ්චිත කාලසීමාවක් ඇතුළත වැඩි කරනු ලැබිය හැකි සීමාවන් නියම කිරීම ;

(ග) නිශ්චිත කාලසීමාවක් ඇතුළත තම ණය ආයෝජන හෝ මූල්‍ය පිළිසරණවල මුදල් ප්‍රමාණය නිශ්චිත සීමාවන්වලට අඩු කිරීමට නියම කිරීම ;

(ච) (i) සමාගමක් සංස්ථා සහ මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් ;

(ii) මුළුමනින්ම—

(අ) සමාගමක් සහ පහත දැක්වෙන ඒවායින් එකක් හෝ වැඩි ගණනක් විසින්—

(අඅ) එහි පාලිත සමාගම් ;

(ආආ) එහි පාලක සමාගම් ;

(ඇඇ) එහි පාලක සමාගමේ පාලිත සමාගමක් ; හෝ

(ඈඈ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තාවූ සමාගමක් ; හෝ

(ආ) පුද්ගලයෙක් සහ පහත දැක්වෙන අය හෝ මණ්ඩල අතුරින් එකක් හෝ වැඩි ගණනක් විසින්—

(අඅ) තමාගේ ඥාතියකු ;

(ආආ) තමාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ තමාගේ ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ ;

(ඇඇ) ඒ සමාගමේ පාලිත සමාගම ;

(ඈඈ) ඒ සමාගමේ පාලක සමාගමක් ;

(ඉඉ) ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක් ;

(ඊඊ) ඒ සමාගමේ හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති සමාගමක් ; හෝ

(උඋ) ඒ පුද්ගලයා හෝ ඔහුගේ ඥාතියාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇත්තා වූ සමාගමක් නොවන සංස්ථාපිත මණ්ඩලයක්

දරනු ලබන මුදල් සමාගමක කොටස් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශතය :

එසේ වුව ද 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ තැනැත්තකු මත පනවන ලද නියමයක් නොවන ආකාරයකින්, මේ පනත ආරම්භ වන දිනයෙහි මුදල් සමාගමක තැනැත්තකුගේ කොටස් අඩු කිරීමක් මේ විධානවලින් නියම කරනු නොලැබිය හැකි ය :

10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මුදල් සමාගමකට නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කරනු පිණිස, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර හෝ පසුව ඒ කොටස ඒ තැනැත්තා විසින් අත්කරගනු ලැබුව ද ඒ සමාගමෙහි ඒ තැනැත්තා විසින් දරනු ලැබූ කොටස් සංඛ්‍යාව ඒ විධානයෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළු ව අඩු කිරීමට ඒ සමාගමෙහි කොටස් දරන තැනැත්තකුට මුදල් සමාගමක් විසින් විධාන කළ හැකිය. තව ද ඒ විධානය අනුව කටයුතු කිරීම ඒ තැනැත්තාගේ කාර්ය වන්නේ ය ;

(ජ) සුරැකුම් කළ අත්තිකාරම් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු අන්තර ;

(ට) සමාගම සහ බදුලාභියා අතර පවත්නා බදු ගිවිසුම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි;

(ඩ) මුදල් සමාගම් මගින් කර ගෙන යනු ලැබිය හැකි කටයුතු වර්ග පිළිබඳ පරිසීමාවන්

(2) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ වූ යම් විධානයක් මගින් නියම කරනු ලබන උපරිම පොලී අනුප්‍රමාණයන්, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලැබුවහොත් භාරගනු ලැබූ යම් තැන්පතුවක් සම්බන්ධයෙන් හෝ ඒ විධානයේ දිනයට පෙර ප්‍රදානය කරනු ලැබූ යම් ණයක්, ණය පහසුවක් හෝ වෙනත් යම් මූල්‍ය පිළිසරණක් සම්බන්ධයෙන් හෝ අදාළ විය යුතුය :

එසේ වුව ද ඒ විධානයේ කිසිවක්—

(අ) එවැනි යම් තැන්පතුවක් හෝ ණයක්, ණය පහසුවක් හෝ වෙනත් මූල්‍ය පිළිසරණක් සම්බන්ධයෙන් ඒ විධානය නිකුත් කළ දිනට ප්‍රථම උපචිත යම් පොලියකට අදාළ නොවිය යුතු ය; නැතහොත්

(ආ) යම් අඩු කිරීමකින් අවස්ථාවෝචිත යම් තැන්පතුවක්, ණයක්, ණය පහසුවක් හෝ මූල්‍ය පිළිසරණක් සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්තුව හෝ ගිවිසුම කඩකිරීමක් සංයුක්ත වන්නේ නම්, විධානයේ දිනයට පෙර භාරගනු ලැබූ යම් තැන්පතුවක් මත හෝ ප්‍රදානය කරනු ලැබූ ණයක්, ණය පහසුවක් හෝ මූල්‍ය පිළිසරණක් මත ගෙවිය යුතු පොලී අනුප්‍රමාණය අඩු කිරීමට නියම කරනු නොලැබිය යුතු ය.

(3) යම් මුදල් සමාගමකට අවශ්‍ය අවස්ථාවක, විශේෂයෙන්ම (1) වන උපවගන්තියේ සඳහන් යම් කාරණා පිළිබඳව මණ්ඩලය විසින්, මේ පනතේ කාර්ය සඳහා විධාන දෙනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් විධානයක් බලාත්මකව පවත්නා අතරතුර යම් අවස්ථාවක දී මුදල් සමාගමක් විසින් තත් කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, නිසි අධිකරණයක් විසින්, ඒ විධානයට යටත් නොවී ස්වකීය ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට ඒ සමාගමට අවසර දෙමින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය. නැතහොත් අධිකරණය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට ඒ විධානය වෙනස්

ක්ෂීම හෝ ලිහිල් කිරීම කරනු ලැබිය හැකි ය. තව ද, මණ්ඩලය විසින් කරන ලද විධානයෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඉහත කී පරිදි අධිකරණය විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් බල සහිත විය යුතු ය.

(4) (ඒ) ඡේදය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කරමින් මුදල් සමාගමක් විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන යම් මුදල් ශේෂයක් මත මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් අනු ප්‍රමාණයක් අනුව මණ්ඩලය විසින් ස්වකීය අභිමතය අනුව පොළී යක් ගෙවිය හැකි ය.

මුදල් සමාගම විසින් අයහපත් පරිචයන් ඇදිය අනුගමනය කරන බවට අධ්‍යක්ෂවරයා ගේ මතය වන අවස්ථාවක කාර්ය පටිපාටිය.

10. (1) අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත මුදල් සමාගමක්—

(i) ස්වකීය තැන්පත්කරුවන්ගේ සම්බන්ධතාවලට හානි කරන අයහපත් හෝ අනිසි මූල්‍ය පරිචයන් අනුගමනය කරන බවට ;

(ii) ස්වකීය තැන්පත්කරුවන්ගේ සම්බන්ධතාවලට හානිකර වන ආකාරයකින් ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඉඩ ඇති බවට ;

(iii) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් විධානයක් කඩකර ඇති බවට හෝ ඒ අනුව කටයුතු කිරීම පැහැර හැර ඇති බවට

මණ්ඩලයේ මතය වන අවස්ථාවක, මණ්ඩලය විසින් ඒ සමාගමට—

(අ) එවැනි යම් පරිචයක් අනුගමනය කිරීම නතර කිරීමට හෝ එවැනි යම් කඩ කිරීමකින් වැළකී සිටීමට ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම ; හෝ

(ඇ) ඒ පරිචයෙන් හෝ කඩකිරීමෙන් සිදුවන තත්ත්වයන් නිරවද්‍ය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ; හෝ

(ඈ) යම් තැනැත්තකු විසින් සමාගමෙහි දරනු ලබන කොටස් සංඛ්‍යාව අඩු කිරීම ඇතිකර ගැනීමට

විධාන කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද නියමයකින් අතෘප්තියට පත් යම් මුදල් සමාගමක් විසින්, ඒ නියමය නිකුත් කිරීමේ දින සිට දින තිහක් ඉකුත් වීමට පෙර මණ්ඩලය වෙත ලිඛිත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර ඒ අභියාචනය ලැබී දින පහළොවක් ඇතුළත මණ්ඩලය විසින් එහි තීරණය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පරීක්ෂා කිරීම පිණිස පොත් ආදිය ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරයා හෝ බලයලත් නිලධරයා විසින් නියම කළ හැකි බව.

**11.** (1) අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මුදල් ව්‍යාපාරික කටයුතු කර ගෙන යනු ලබන බව නිසැකව දැන ගැනීමෙහිලා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට නියම කරනු ලැබිය හැකි ය. තව ද, මේ කාර්යය සඳහා එම තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට අදාළ යම් පොත් හෝ වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය මුදල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බව ඔහුගේ මතය වේ නම්, ඒ බව මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාවක් සළකා බැලීමෙන් පසු, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් මුදල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන බව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නේ නම්, නිශ්චිත කාල සීමාවක් ඇතුළත පනතේ නියමවලට අනුකූලව කටයුතු කරන ලෙස එම තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට නියම කරනු ලැබිය යුතු අතර, එසේ කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක විධාන දීමේ බලය එය සතු විය යුතු ය. තව ද එබඳු අවස්ථාවක දී, 18 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කෙරෙන පුද්ගලයන්ගේ හෝ පුද්ගල මණ්ඩලවල ගණන් බේරා වසා දැමීමේ බලය ද ඇතුළුව, තැන්පත් කරුවන් ආරක්ෂා කිරීමෙහි ලා අවශ්‍ය යයි සලකන යම් පියවර ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු සැපයීමට හෝ පොත් හෝ වාර්තා කිසිවක් ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, අධ්‍යක්ෂකවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු වෙත එම තොරතුරු සැපයීම හෝ එම පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ කරන ලද විධාන හෝ නියම කිසිවකට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් භාරගනු ලැබූ, ණයට ගනු ලැබූ හෝ ඉල්ලා ගනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් තැන්පත් මුදලක් දැයි නිසැකව දැනගැනීමෙහිලා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය.

මුදල් සමාගමක පොත් සහ ගිණුම් පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂවරයා සතු බලය.

**12.** (1) අධ්‍යක්ෂවරයා විසින් කවර විටක දී වුව ද, යම් මුදල් සමාගමක පොත් සහ ගිණුම් පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට බලය දීම කරනු ලැබිය හැකි ය.

(2) එම පරීක්ෂණය සම්පූර්ණ කළ වහාම අධ්‍යක්ෂවරයා විසින් එවැනි යම් පරීක්ෂණයක වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි පරීක්ෂණයක පිරිවැය අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගමෙන් අයකරගනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ පහත දැක්වෙන කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය—

(අ) දිවුරුම් ආඥාපනතට අනුකූලව යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක්, ලේකම්වරයෙක්, සේවා නියුක්තයෙක් හෝ විගණකවරයෙක් ලවා දිවුරුම් හෝ ප්‍රතිඥා ගැනීම ;

(ආ) මෙම පනතේ කාර්යය සඳහා සමාගමේ කටයුතුවලට අදාළ වන්නා වූ ද අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු නිසැකව දැන ගැනීමට අවශ්‍ය යයි සලකනු ලබන්නා වූ ද යම් සියලු තොරතුරු සපයන ලෙස යම් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, ලේකම්වරයකුට, සේවා නියුක්තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම ;

(ඇ) එවැනි යම් තොරතුරක් ඇතුළත් විය හැකි තමා සන්තකයේ හෝ භාරයේ තිබෙන සමාගමේ කටයුතුවලට අදාළ පොත් වාර්තා හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට, ලේකම් වරයකුට සේවා නියුක්තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම ; සහ

(ඈ) මුදල් සමාගමක් අයථා ලෙස කළමනාකරණය කරනු ලැබ ඇති බවට සාක්ෂි ඇති අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද විගණකවරයකු විසින් විගණනය කිරීම සඳහා මුදල් සමාගමේ ගිණුම් ඉදිරිපත් කරන ලෙස එම මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකාරවරයකුට හෝ ලේකම්වරයකුට, නියම කිරීම සහ යම් තොරතුරු සපයන ලෙස හෝ යම් පොත්, වාර්තා හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැක්කා වූ හෝ බලය දෙනු ලැබිය හැක්කා වූ හෝ යම් ගාස්තු මෙම විගණකවරයාට ගෙවන ලෙස යම් මුදල් සමාගමකට නියම කිරීම.

(4) මේ වගන්තිය යටතේ තමන් වෙත නියම කරන ලද යම් නියමයකට අනුකූලව කටයුතු කිරීම සහ අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හෝ (3) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකුට හෝ ඒ මුදල් සමාගමේ මුදල් ශේෂ, වත්කම් සහ බැරකම් ඇතුළු එහි සියලු පොත් සහ වාර්තා බැලීමේ මාර්ග සැලැස්වීම කළ යුතු යයි අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලබන කවර විටක වුව ද එසේ කිරීම යම් මුදල් සමාගමක සෑම අධ්‍යක්ෂවරයකුගේම, කළමනාකාරවරයකුගේම, ලේකම් වරයකුගේම, සේවානියුක්තයකුගේම හෝ විගණකවරයකුගේම කාර්යය වන්නේ ය.

(5) අධ්‍යක්ෂවරයා විසින් යම් මුදල් සමාගමක කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිසැකව දැනගැනීම සඳහා සහ ඒ මුදල් සමාගම එහි වර්තමාන හෝ අනාගත තැන්පත්කරුවන්ට අනර්ථදායී ලෙස ව්‍යාපාරය කරගෙන යන බව නිසැකව දැනගැනීම සඳහා අවශ්‍ය යයි, තමා සලකන අවස්ථාවක, මුදල් සමාගමට අදාළ තොරතුරු තමා වෙත හෝ තමා විසින් බලය දෙන නිලධරයකු වෙත හෝ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ තමා විසින් බලය දෙන ලද යම් විගණකවරයකු වෙත සපයන ලෙස හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි යම් කරුණු පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය හැකි වන පරිදි ඒ දැන්වීමෙහි නියම කරනු ලබන යම් ස්ථානයකදී, යම් දිනයක සහ වේලාවක තමා ඉදිරියේ හෝ තමා විසින් බලය දෙන ලද යම් නිලධරයකු ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටින ලෙස හෝ ඒ තොරතුරු ඇතැයි සැලකෙන යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(6) මුදල් සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය තත්ත්වය නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂවරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීම අවශ්‍ය යයි තමා සිතන්නේ නම්, යම් අදාළ අවස්ථාවක—

(අ) පරීක්ෂණයට භාජනව පවත්නා මුදල් සමාගමේ පාලක සමාගමක් හෝ පාලිත සමාගමක් ;

(ආ) ඒ මුදල් සමාගමේ පාලක සමාගමක පාලිත සමාගමක් ; සහ

(ඇ) ඒ මුදල් සමාගමේ ආශ්‍රිත සමාගමක්

වශයෙන් පවතින්නා වූ හෝ පැවතුනා වූ යම් සමාගමක ව්‍යාපාරික කටයුතු ද පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන මගින් තමා වෙත පැවරෙන බලතල අතුරෙන් කිසිවක්, එවැනි යම් සමාගමකට අදාළව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියෙහි " ආශ්‍රිත සමාගම " යන්නෙන්, මුදල් සමාගම කට අදාළව යෙදු විට, සමාගමේ ගෙවූ කොටස් මුදලින් සියයට විස්ස කට හෝ වැඩි ගණනකට සමාන වූ, එහෙත් සියයට පණහකට වඩා අඩු වූ සාමාන්‍ය කොටස්, මුදල් සමාගම විසින් දරන්නා වූ සමාගමක් අදහස් වේ.

12 වන වගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත සමාගමට එරෙහිව ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර එහි තත්ත්වය ප්‍රකාශ කිරීමට මණ්ඩලය විසින් සමාගමට ඉඩ දීම.

12අ. 12 වන වගන්තිය හෝ 13 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාවක් පදනම් කරගෙන මුදල් සමාගමට එරෙහිව ක්‍රියා මාර්ගයක් ගත යුතු යයි මණ්ඩලය යෝජනා කරන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නිර්දේශ ඇතුළත් කොටස නොමැතිව ඒ වාර්තාවේ පිටපතක් මණ්ඩලය විසින් ඒ සමාගම වෙත සපයනු ලැබිය යුතු අතර, එම වාර්තාව පිළිබඳව එම සමාගමේ තත්ත්වය මණ්ඩලය වෙත ප්‍රකාශ කිරීමට යටත් පිරිසෙයින් සත් දවසක කාලයක් සඳහා සමාගමට ඉඩදිය යුතු ය :

තැන්පත්කරුවන්ගේ සහ මුදල් සමාගමේ යහපත තකා වහා ක්‍රියා කිරීම අවශ්‍ය යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, එම වාර්තාව පිළිබඳ ව සමාගමේ තත්ත්වය ප්‍රකාශ කිරීම සඳහා සමාගමට අවසර නොදෙමින් වාර්තාව පිළිබඳ ව මුදල් මණ්ඩලය ක්‍රියා කිරීම තහනම් කෙරෙන කිසිවක් මේ උපවගන්තියේ ඇතැයි සලකනු නොලැබිය යුතු ය.

මුදල් සමාගමේ ගිණුම්.

13. සෑම මුදල් සමාගමක් විසින් ම එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු—

(අ) එක් එක් මුදල් වර්ෂයේ අවසාන වැඩකරන දිනය තෙක් වූ ශේෂ පත්‍රයක් ; සහ

(ආ) එම වර්ෂය වෙනුවෙන් ලාභාලාභ ගිණුමක් පිළියෙල කරනු ලැබිය යුතුය.

මුදල් සමාගමේ ශේෂ පත්‍රය.

14. (1) මුදල් සමාගමක ශේෂ පත්‍රයෙහි එම ශේෂ පත්‍රය අදාළ වන මුදල් වර්ෂය අවසානයේ එම සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්වය දැක්විය යුතුය.

(2) ශේෂ පත්‍රයෙහි හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක—

(අ) වෙන වෙනම වූ ශීර්ෂ යටතේ ස්පර්ශ්‍ය වත්කම්වලින් නියෝජනය නොවන ප්‍රාග්ධන වියදම් කපා නොහරින ලද්දේ නම්, ඒ වියදම් :

(ආ) ආයෝජනවල වෙළඳ අගය ;

(ඇ) මුදල් වර්ෂය තුළ ස්ථාවර වත්කම් තක්සේරු කරන්නට යෙදුනේ නම්, ඒ ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට යොදාගත් ක්‍රමය ;

(ඈ) බොල් සහ සැක සහිත ණය සඳහා සලසා ඇති අඩු කිරීම් වලින් පසු අත්තිකාරම්වල මුළු මුදල ;

(ඉ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂය වීම, අලුත් කිරීම හෝ අඩුවීම සඳහා වූ ප්‍රතිපාදනයෙහි යම් වැඩි වීමක් හෝ අඩු වීමක් ;

(ඊ) අරමුදල් ප්‍රභව සහ යෙදවීම ;

(උ) සංචිත ප්‍රතිපාදන සහ එකිනෙකින් වෙනස් වූ බැරකම් ;

(ඌ) මේ පනත ආරම්භවීමේ දිනයෙන් පසුව වූ පළමුවන ශේෂ පත්‍රය සම්බන්ධයෙන් හැරෙන්නට ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ඉහතින් වූ මුදල් වර්ෂය අවසානයේ තිබූ අනුරූපී මුදල් ප්‍රමාණ.

ලාභාලාභ ගිණුම.

**15.** ලාභාලාභ ගිණුමේ හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක—

(අ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂයවීම, අලුත් කිරීම හෝ අඩු වීම සඳහා වූ ප්‍රතිපාදනය මගින් ආදායමින් ගෙවනු ලැබූ මුදල් ;

(ආ) ලාභ මත ශ්‍රී ලංකා ආදායම් බද්ද සහ වෙනත් ශ්‍රී ලංකා බදු සඳහා ආදායමින් ගෙවූ මුදල සහ ඒ ගිණුම්වලින් වෙනස් ව පවත්නා බදු වර්ෂය හෝ පසුව එළඹෙන වර්ෂයක් වෙනුවෙන් අයවිය යුතු බදු සම්බන්ධයෙන් වූ බැරකම් සඳහා වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත මුදල් ;

(ඇ) ගෙවන ලද හෝ ගෙවීමට යෝජිත ලාභාංශවල මුළු මුදල ;

(ඈ) විගණකවරුන්ගේ පාරිශ්‍රමික මුදල ;

(ඉ) අධ්‍යක්ෂවරයන්ගේ වේතනවල මුළු මුදල නියෝජනය වන ආදායමින් ගෙවූ මුදල ;

(ඊ) සංචිතවලට වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත හෝ ඉන් ආපසු ගන්නා ලද මුදල ;

(උ) මුදල් සමාගම විසින් සාමාන්‍යයෙන් භාර නොගන්නා සහ සුවිශේෂ හෝ පුරනාවර්තන නොවන ස්වභාවයේ කරුණු හේතු කොට ගෙන භාරගන්නා ගනුදෙනුවලින් පැන නගින වෙන වෙනම වැය ශීර්ෂ යටතේ වූ ගිණුම් තැබීමේ පදනමෙහි වෙනස් කිරීමක් නිසා ඇති වන ලාභයක් හෝ පාඩුවක් සහ ආදායම සහ වියදම් ;

(ඌ) මේ පනත ආරම්භ වීමේ දිනයෙන් පසු, ප්‍රථම ලාභාලාභ ගිණුම සම්බන්ධයෙන් හැර, ලාභාලාභ ගිණුමේ පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ඉහතින්ම වූ මුදල් වර්ෂය අවසානයේ තිබූ අනුරූපී මුදල් ප්‍රමාණ.

මුදල් සමාගමේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පළ කිරීම.

**16.** (1) සෑම මුදල් සමාගමක් විසින්ම, මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ඇතුළත—

(අ) ඒ මුදල් වර්ෂය සඳහා වූ සමාගමේ ලාභාලාභ ගිණුම ;

(ආ) එම ලාභාලාභ ගිණුම සකස් කරන ලද දිනය තෙක් වූ ශේෂ පත්‍රය ;

(ඇ) එම ලාභාලාභ ගිණුමට සහ ශේෂ පත්‍රයට අමුණන ලද විගණකවරයාගේ වාර්තාව ; සහ

(ඈ) එම ශේෂ පත්‍රයට අමුණන ලද සමාගමේ කටයුතුවලට අදාළ අධ්‍යක්ෂවරයන්ගේ වාර්තාව

අධ්‍යක්ෂවරයා වෙත යවා, ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) සෑම මුදල් සමාගමක් විසින් ම, එම සමාගමේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම, එහි ව්‍යාපාරික කටයුතු කරනු එක් එක් ස්ථාන යෙහි ප්‍රකට කොටසක, පසුව එළඹෙන මුදල් වර්ෂයේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක්, ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින්, මේ වගන්තියෙහි සඳහන් ශේෂ පත්‍රයේ සහ ලාභාලාභ ගිණුමේ ආකෘතිය නිශ්චය කරනු ලැබිය හැකි අතර, සෑම මුදල් සමාගමකම ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම එසේ නිශ්චිත එම ආකෘතියෙහි පිළියෙළ කරනු ලැබිය යුතු ය.

17. මුදල් සමාගමක විගණකවරයා විසින් සමාගමක ගිණුම්, මුදල්, මුදල් කළමනාකරණය සහ දේපළ පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතු ය. විගණකවරයා විසින් හැකිතාක් දුරට සහ අවශ්‍ය වන තාක් දුරට— ගිණුම් විගණනය කිරීම.

(අ) මුදල් සමාගම පවත්වාගෙන යාම නීති රීති සහ මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව කර ඇත්තේ ද ;

(ආ) නැත්පතු භාර ගැනීම සහ ගිණුම් පවත්වා ගෙන යාමට අදාළ වාර්තා සතුටුදායක ලෙස කර ඇත්තේ ද ;

(ඇ) ගිණුම් ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන, මුදල් පාලන කාර්යය පිළිබඳ මතය සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ මතය අනුව මුදල් සමාගමේ කටයුතු පිළිබඳව අඛණ්ඩ අගැයීමක් කළ හැකි වන පරිදි නිසි අයුරින් හා ප්‍රමාණවත් අයුරින් සැලසුම් කර ඇත්තේ ද යන බව සහ ඒ ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායි ලෙස ක්‍රියාත්මක වන්නේ ද ;

(ඈ) ගණකාධිකරණය, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම පිළිබඳ මූලධර්ම කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, සැලකිල්ලට භාජනව ඇති කාලසීමාව සම්බන්ධයෙන් මුදල් සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ අදහසක් ගෙන හැර දක්වන පරිදි විගණනය කරන ලද ගිණුම් සැලසුම් කර ඇත්තේ ද

යන බව පරීක්ෂා කර බැලිය යුතු ය.

ගණන් බේරු වසා දැමීම.

18. (1) අධ්‍යක්ෂවරයා විසින් ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ යම් මුදල් සමාගමක කටයුතු පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව හෝ සමාගමෙන් ලැබුණු තොරතුරු අනුව හෝ එම සමාගම බුන්වත් යයි හෝ එහි තැන්පත් කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට එය පත්වීමට ඉඩ තිබේ යයි හෝ එම සමාගම ව්‍යාපාර කටයුතුවල තවදුරටත් යෙදී සිටීම නිසා එහි තැන්පත්කරුවන්ට හෝ ණය හිමියන්ට පාඩු සිදුවීමට ඉඩ තිබේ යයි අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ඒ අනුව වාර්තාවක් යැවිය යුතු ය. තවද, සිද්ධීන් සහ කරුණු සමාලෝචනයට භාජනය කිරීමෙන් පසුව් මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි ක්‍රියා කළ යුතු යයි මණ්ඩලය අදහස් කරතහොත්, ව්‍යාපාර කටයුතු වහාම අත් හිටු වන ලෙස සමාගමට විධාන කරමින් සහ සමාගමේ සියලුම පොත්, වාර්තා සහ වත්කම් භාර ගන්නා ලෙසත්, සමාගම විසින් ව්‍යාපාර කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙසත් අධ්‍යක්ෂවරයාට විධාන කරමින් මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) සමාගමේ පොත්, වාර්තා හෝ වත්කම් කිසිවක් තම සන්තකයේ හෝ භාරයේ ඇත්තා වූ ද, ඒ පොත්, වාර්තා හෝ වත්කම් අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු වෙත භාර දීම පැහැර හරින්නා වූ ද, යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු හෝ යම් පොත්, වාර්තා හෝ වත්කම් භාර ගැනීමේ දී හෝ සමාගමේ ව්‍යාපාරික කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වළක්වා ලීමෙහි ලා අධ්‍යක්ෂවරයා සලකන යම් වෙනත් පියවර ගැනීමේ දී අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට අවසර දීමට අවසිර කරන හෝ අවසර දීම පැහැර හරින යම් තැනැත්තකු පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) වෙන යම් නීතියක කුමක් සඳහන් ව ඇත ද, (1) වන උප වගන්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් නියමයක් සමාලෝචනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට සලස්වා ගැනීමේ කාර්යය සඳහා හෝ නියමය නිසා සිදුවූ හෝ සිදු වීමට ඉඩ තිබෙන හෝ සිදු වී යයි කියනු ලබන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ කිසිම අධිකරණයක යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය හැකි ය.

(4) යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරන ලද යම් නියමයක බලපෑම, එය කරන ලද දින සිට දින හැටක කාලයක් ඉකුත් වූ විට අවසාන විය යුතු අතර, හැකිතාක් ඉක්මණින්, සහ කෙසේ වුවද එකී කාලසීමාව ඉකුත්වීමට පෙර—

(අ) කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය සලකන යම් කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට සමාගමට අවසර දෙමින් නියමයක් කිරීම; හෝ

(ආ) සමාගම ගණින් බේරා වසා දැමීම සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි නිසි බලය ඇති අධිකරණයක් වෙත අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීමට අදහස් කරන බව මුදල් සමාගම වෙත දැනුම් දීම

මණ්ඩලයේ කාර්යය වන්නේය.

(අ) ඡේදය මගින් පැවරී ඇති බලතලවල සමාන්‍යත්වයට හානියක් නොමැතිව සහ වෙන යම් නීතියක හෝ සමාගමේ සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇතද, මණ්ඩලය විසින් ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දීම සඳහා වූ කොන්දේසියක් වශයෙන් එම සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ සේවානියුක්තයකු තවදුරටත් කටයුතු කරගෙන යාම. එහි තැන්පත්කරුවන්ගේ යහපතට හානිකර යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ සේවා නියුක්තයා ඉවත් කිරීම සහ ඒ සමාගමේ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ සේවානියුක්තයා වශයෙන් යම් තැනැත්තකු පත් කිරීම කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, අධ්‍යක්ෂවරයන් වශයෙන් එසේ පත් කරන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාවෙන්, එම මුදල් සමාගමේ, මණ්ඩලයේ බහුතරයක් සංස්ථාපනය නොවිය යුතු ය.

(5) 43 වන වගන්තියට අනුකූලව මුදල් සමාගම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ නොමැති නම් හෝ ඒ වගන්තියට අනුකූලව කරන ලද මුදල් සමාගමේ ඉල්ලීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත්නම් හෝ සමාගම ගණින් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක ව්‍යාපාරික කටයුතු අත්හිටුවන ලද කාලසීමාව තුළ එකී සමාගමේ හෝ ඒ සමාගමේ පරිපාලනයට සම්බන්ධ වියදම් කිසිවක් දැරීම පොදු යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන්නේ නම්, මහ බැංකුවේ අරමුදල්වලින් ඒ වියදම් දැරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂවරයා විසින් කරන ලද යම් ඉල්ලීමක් මත යම් මුදල් සමාගමක් ගණින් බේරා වසා දැමිය යුතු යයි නිසි බලය ඇති අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, 1982 අංක 17 දරන සමාගම් පනතේ සමාගම් ගණින් බේරා වසා දැමීමට අදාළ විධිවිධාන එම සමාගම ගණින් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(8) මේ පනත යටතේ පුද්ගලයකුගේ හෝ (සමාගමක් නොවන) පුද්ගල මණ්ඩලයක ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විටක, ඈවරකරු සුදුසු යයි සිතන යම් ආකාරයකට සහ පදනමක් මත පුද්ගලයකුගේ හෝ පුද්ගල මණ්ඩලයක වත්කම් සහ බැරකම්වල අගය නිසැකව දැනගත යුතු ය. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු කවර විටක වුව ද, නිසි බලය ඇති අධිකරණය විසින්, ඈවරකරුට සියලුම වත්කම් මුදල් කර ගැනීමට බලය දිය හැකි අතර, එම පුද්ගලයාට හෝ පුද්ගල මණ්ඩලයට හිමිකම ඇත්තා වූ ද ඔහු වෙත තිබෙන්නා වූ ද යම් මුදලක්, දේපළක් හෝ පොත් සහ වෙනත් ලේඛන වහාම හෝ නිශ්චිත කාලයක් ඇතුළත ඈවරකරුට ගෙවන ලෙස, භාරදෙන ලෙස, සමර්පණය කරන ලෙස, පවාරණය කරන ලෙස හෝ පවරන ලෙස ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය. එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා වැඩ පිළිවෙලක් ඈවරකරු විසින් පිළියෙල කරනු ලැබ, ස්ථිර කිරීම සඳහා එය නිසි බලය ඇති අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ගණන් බේරා වසා දැමීම ඒ වැඩ පිළිවෙල අනුව කරගෙන යා යුතු ය.

(9) යම් මුදල් සමාගමක, පුද්ගලයකුගේ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක (සමාගමක් නොවන) ගණන් බේරා වසා දැමීම සඳහා මේ වගන්තිය යටතේ හෝ අන්‍යාකාරයකින් කරන ලද ඉල්ලීමක් අනුව ආඥාවක් කරන ලද යම් අවස්ථාවක, වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද එම ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඈවරකරු ලෙස අධ්‍යක්ෂවරයා හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. සමාගමක් නොවන පුද්ගලයකුගේ හෝ පුද්ගල මණ්ඩලයක ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කරන ලද අවස්ථාවක, මේ යටතේ පත් කරන ලද ඈවරකරුවකුගේ පාරිශ්‍රමිකය සහ ගණන් බේරා වසා දැමීමෙහි ලා නිසි ලෙස දරන සියලු පිරිවැය, ගාස්තු සහ වියදම්, වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වූව ද, ගණන් බේරා වසා දැමීමේ දී දැරීමට සිදු වූ එම පුද්ගලයාගේ හෝ පුද්ගල මණ්ඩලයේ වත්කම්වලින්, වෙනත් සියලු හිමිකම්පෑම්වලට ඉහළින් ප්‍රමුඛත්වය දී ගෙවනු ලැබිය යුතු ය.

(10) යම් මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමෙහිලා දරන ලද යම් පිරිවැය, ගාස්තු සහ වියදම් පොදු යහපත තකා මහ බැංකුවේ අරමුදල් වලින් ගෙවිය යුතු යයි මණ්ඩලය සලකන අවස්ථාවක, එසේ කරනු ලැබිය හැකි ය.

(11) යම් මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා (4) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරන ලද යම් අවස්ථාවක—

(අ) ඉල්ලීම විනිශ්චයට භාජනව පවත්නා කාලය තුළ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට අධිකරණය විසින් බලය දෙනු ලැබ ඇත්නම් මිස සහ අධිකරණය නියම කරනු ලබන කොන්දේසි කිසිවක් වේ නම්, ඒ කොන්දේසිවලට අනුකූලව මිස, සමාගම විසින් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන නොයා යුතු ය : තව ද,

(ආ) අධිකරණය අවශ්‍ය යයි සලකන යම් විභාගයකින් පසුව සමාගම බුන්වත් නොවේ යයි අධිකරණයේ මතය වුව හොත් කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි අධිකරණය සලකන යම් කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට මුදල් සමාගමට අවසර දෙමින් අධිකරණය විසින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.

(12) නිසි බලය ඇති අධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක්ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ හැකි අභියාචනයකට යටත් විය යුතු අතර, සිවිල් නඩු පිළිබඳ අභියාචනා සම්බන්ධයෙන් (101 වන අධිකාරය වන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුවද (11) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ආඥාවක් අවසානාත්මක විය යුතු ය.

(13) මේ වගන්තිය යටතේ නිසි බලය ඇති අධිකරණයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක්ම රුපියල් පන් දහසක වටිනාකමින් යුත් නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(14) මේ වගන්තියේ යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් වූ විට “ නිසි බලය ඇති අධිකරණය ” යන්නෙන්, කොළඹ දිසා අධිකරණය හෝ මුදල් සමාගමේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික්කයක හෝ දිසා අධිකරණය අදහස් වේ.

තොරතුරු සැපයීම. පැහැර හැරීම සහ වරද.

19. (අ) පෞද්ගලිකව පෙනී සිටින ලෙස හෝ යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් 12 වන වගන්තිය යටතේ නියම කරන ලද විටක එසේ කිරීම පැහැර හරින හෝ 12 වන වගන්තිය යටතේ යම් පරීක්ෂණයක් කිරීමට අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හෝ 12 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද විගණකවරයකුට බාධා කරන හෝ අවසර දීම පැහැර හරින යම් මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(ආ) අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු වෙත හෝ 12 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ඔහු විසින් බලය දෙන ලද යම් විගණකවරයකු වෙත හෝ ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක අසත්‍ය යයි තමා දන්නා ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

මුදල් සමාගමක් පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම මණ්ඩලය විසින් භාරගත හැකි බව.

**20.** (1) 18 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් ලැබුණු විට සිද්ධීන් සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසු, මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි මුදල් සමාගමක් ණය ගෙවිය හැකි ස්ථායි තත්ත්වයකට පත් කළ හැකි යයි මණ්ඩලයේ මතය වුවහොත්, මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් මගින්, එම දැන්වීමේ සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය භාර ගනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තදනන්තර දැන්වීමක් මගින් මුල් දැන්වීමේ සඳහන් කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය. එවැනි සෑම දැන්වීමක ම පිටපතක් සමාගම් රෙජිස්ට්‍රාර් වෙත යැවීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඒ බවට සමාගමට අදාළ පොත්වල සටහනක් කරනු ලැබිය යුතු ය.

(2) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය භාර ගන්නා අවස්ථාවක මණ්ඩලය විසින්—

(අ) එම මුදල් සමාගම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් එම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කරන ලද සියලු බලතල, කාර්ය සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සහ ඉටු කිරීම ;

(ආ) සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත සැලකිල්ලට ගනිමින් සහ පොදු යහපත තකා මණ්ඩලය සහ යම් පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් අතර එකඟ විය හැකි යම් කොන්දේසිවලට යටත්ව මුදල් සමාගමේ කළමනාකරණය සඳහා ඒ පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය සමග යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ඇ) මුදල් සමාගම, වෙනත් මුදල් සමාගමක් හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් වැඩ පිළිවෙලවල් එකී වෙනත් මුදල් සමාගමේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව සකස් කිරීම ;

(ඈ) යම් මුදල් සමාගමක ප්‍රාග්ධනය වැඩි කිරීමෙන්ද අලුත් කොටස්කරුවන් බඳවා ගැනීමේ වැඩපිළිවෙලක් යෙදීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය පුනස්ථාපනය කිරීමෙන්ද එය ප්‍රතිසංවිධානය කිරීම ;

(ඉ) තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන ආකාරයකට එම මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කළ හැකිය ;

(ඊ) පහත දැක්වෙන පරිදි, එනම් :—

(i) සමාගමේ කොටස් සඳහා මිල ගණන් කැඳවා ඇති අවස්ථාවක, වෙළඳ පොළ අගය අනුව ; හෝ

(ii) කොටස් සඳහා එසේ මිල ගණන් කැඳවා නොමැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිල අනුව තීරණය කරනු ලබන වන්දි මුදලක් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට තමන්ට අයිති කොටස්වල අයිතිය ඒ තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස යම් මුදල් සමාගමක කොටස් හිමියන්ට ලිඛිත දැන්වීමක් මගින් විධාන කළ හැකි ය.

(3) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගන්නා ලද කාලසීමාව තුළ එම මුදල් සමාගමේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක් සහ ලේකම්වරයෙක් විසින්ම, එම සමාගම සම්බන්ධයෙන් වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම, මණ්ඩලය විසින් එසේ කිරීමට ප්‍රකාශිතව ම බලය දෙනු ලැබ ඇත්නම් මිස, අවසන් කරනු ලැබිය යුතු ය.

(4) මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක මහජන යහපත සඳහා වේ යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අවස්ථාවක—

(අ) මුදල් සමාගමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නා වූ මුදල් පහසුකම්, ප්‍රදාන වශයෙන් හැර, ණය මුදල් හෝ වෙනත් පහසුකම් වශයෙන් එම මුදල් සමාගමට පිළියෙල කරදීම හෝ ප්‍රදාන කිරීම කළ හැකි ය ; තව ද

(ආ) සමාගමේ පරිපාලනය හා කළමනාකරණය කරගෙන යාමේදී දරන්නට සිදු වූ සියලු ගාස්තු අයකිරීම් සහ වියදම් ගෙවිය හැකි ය :

එසේ වුව ද (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය පවරා ගැනීමෙන් පසුව යම් අවස්ථාවක, සමාගමේ ව්‍යාපාරය තාවකාලිකව අත්හිටුවීම, මහජනයාගේ හෝ තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නේ නම් මණ්ඩලය විසින් එම ව්‍යාපාර කටයුතු එසේ අත්හිටුවිය හැකි ය. එසේ නැතහොත් සාධාරණ කාලසීමාවක් ඇතුළත සමාගම ආර්ථික ප්‍රරෝහය ශක්තියුක්ත කිරීමට හෝ නුබුන්වත් කිරීමට හෝ නොහැකි බව අධ්‍යක්ෂවරයා විසින් හෝ මණ්ඩලයෙන් බලයලත් යම් තැනැත්තකු විසින් කරන ලද වාර්තාවක් අනුව මණ්ඩලයට පෙනී යන්නේ නම්, සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලුම් කරන ලෙසට අධ්‍යක්ෂවරයාට විධාන කළ හැකි ය. මුදල් සමාගම ගණන් බේරා වසා දමන ලෙසට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට විධාන කළහොත්, ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ වූ විධිවිධාන අදාළ විය යුතු ය.

මණ්ඩලය විසින් තාවකාලික මුදල් පහසුකම් සැලසීම.

**21.** (1) යම් මුදල් සමාගමකට තාවකාලික මුදල් පහසුකම් සලසා දීම, තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි, අධ්‍යක්ෂවරයා විසින් ම හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් එම සමාගමේ කටයුතු පරීක්ෂා කිරීමෙන් පසුව හෝ මුදල් සමාගමෙන් ලැබුණු තොරතුරු මත හෝ අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වූ යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ බව මණ්ඩලයට වාර්තා කළ යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත ඒ මුදල් සමාගමට ණයට දීමේ කාර්යය සඳහා (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ 88ඉ වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍ය හා දීර්ඝකාලීන ණය අරමුදලෙන් ණයක් හෝ අත්තිකාරමක් මණ්ඩලය විසින් වාණිජ බැංකුවකට ප්‍රදානය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වාණිජ බැංකුවකට ප්‍රදානය කරන ලද යම් ණයක් හෝ අත්තිකාරමක් සම්බන්යෙන්, මුදල් නීති පනතේ 88ආ සිට 88ඉ දක්වා වූ වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු ය.

පරිපාලනය පවරා ගනු ලැබූ මුදල් සමාගම් විසින් එළඹෙන ලද ගිවිසුම් වෙනස් කිරීමට මණ්ඩලයට ඇති බලය.

**22.** මේ පනතේ හෝ වෙනත් නීතියක විධිවිධාන කෙසේ වුව ද මණ්ඩලය විසින්—

(අ) කළමනාකරණය හා පරිපාලනය මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ මුදල් සමාගමක් සමග තැන්පත්කරුවකු විසින් ඇතුළත් වූ යම් ගිවිසුමක් සමාලෝචනය කළ හැකි වන අතර තැන්පත්කරුවන්ගේ හෝ ණය හිමියන්ගේ යහපත ගැන හෝ දූරදර්ශී වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ලකින් තොරව එම ගිවිසුමට එළඹ ඇතැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අවස්ථාවක, ආපසු ගෙවීම, පොලී අනුපාතික හා අයකිරීම් සම්බන්ධයෙන් වූ නියමයන් ඇතුළු ව, එම ගිවිසුමේ නියමයන් වෙනස් කළ හැකි ය ;

(ආ) කළමනාකරණය හා පරිපාලනය මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ මුදල් සමාගමක් විසින් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ඇතුළත් වී ඇති යම් එකගවීමක් හෝ ගිවිසුමක් සමාලෝචනය කළ හැකි වන අතර ඒවැනි සමාලෝචනයකින් පසු තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත ගැන නිසි සැලකිල්ල නොදක්වා හෝ දූරදර්ශී වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ල නොදක්වා එම එකග වීමට හෝ ගිවිසුමට එළඹ ඇති බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, එම ගිවිසුමේ නියමයන් වෙනස් කළ හැකි ය.

නඩුවලින් ආරක්ෂාව.

**23.** මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය මණ්ඩලය විසින් 20 වන වගන්තිය යටතේ පවරා ගෙන ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් නිසා හෝ 20 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට පැවරුණු, නියම වුනු හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේදී හෝ යම් තැනැත්තකුට සිදුවූ හෝ විඳින්නට සිදුවූ

හෝ සිදුවූයේ යයි හෝ විදින්නට සිදු වූයේ යයි කියනු ලබන හෝ යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු නොවන අතර ඒ සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නඩුව කට හෝ නඩු කටයුත්තකට මණ්ඩලය යටත් නොවිය යුතු ය.

මුදල් සමාගම්වල කළමනාකරණය ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත සතු කිරීම.

24. (1) මණ්ඩලය විසින් මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය 20 වන වගන්තිය යටතේ පවරා ගෙන ඇති අවස්ථාවක, තැන්පත්කරුවන්ගේ හෝ ණය හිමියන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීමට පියවර ගැනීම සඳහා එම මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ තැනැත්තකු වෙත එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ තැනැත්තාගේ කැමැත්ත ඇතිව සතු කළ හැකි ය. එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට, එම මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය එම ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ තැනැත්තා වෙත සතු වන අතර එම ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ තැනැත්තා විසින් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී, නියම වී හෝ වෙන් කර දී ඇති සියලු බලතල කාර්ය හා කර්තව්‍ය එම මුදල් සමාගම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ තැනැත්තකු වෙත සතු කර ඇති අවස්ථාවක පහත දැක්වෙන පරිදි, එනම් :—

(i) සමාගමේ කොටස් සඳහා මිල ගණන් කැඳවා ඇති අවස්ථාවක, වෙළඳ පොළ අගය අනුව ; හෝ

(ii) කොටස් සඳහා එසේ මිල ගණන් කැඳවා නොමැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිල අනුව

ගණන් බලනු ලබන වන්දි මුදලක් ගෙවනු ලැබූ විට තමන්ගේ කොටස් මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් අවසතු කරන ලෙස හෝ එකී තැනැත්තාට පවරන ලෙස යම් සමාගමක කොටස් හිමියකුට විධාන කළ හැකි ය.

අධ්‍යක්ෂවරයා විසින් 18 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයූ පසු ගත යුතු පියවර.

25. (1) අධ්‍යක්ෂවරයා විසින් 18 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයූ පසු සහ මණ්ඩලය විසින් කරුණු සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසුව මුදල් සමාගමක යම් ආදී හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, සේවා නියුක්තිය හෝ අනුයෝජිතයකු සමාගමට අයිති යම් මුදලක් හෝ දේපලක් අයථා පරිදි යෙදවීමෙන් වංචනික ලෙස ද සාවද්‍ය හෝ නීති විරෝධී ලෙස ද තමා ම පොහොසත් වී හෝ වෙනත් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නේ නම්, 18 වන හෝ 20 වන වගන්තිය යටතේ ද එවකටත් ක්‍රියා මාර්ගයක් ගෙන

තිබුණද, මුදල් සමාගමට ආරෝපණය කළ හැකි මුදල් හෝ දේපළ සුදුසු යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන අනුප්‍රමාණයක වූ පොලිය ද සමඟ, මණ්ඩලය විසින් නිශ්චිත ව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක් ඇතුළත ආපසු ගෙවන ලෙස හෝ ආපසු ලබා දෙන ලෙය එම තැනැත්තාට හෝ තැනැත්තන්ට නියම කළ හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු මෙහි මින් පෙර සඳහන් මුදල් හෝ දේපළ මුදල් සමාගමට නැවත ලබා දීම පැහැර හරින අවස්ථාවක මණ්ඩලය විසින් :—

(අ) පහත දැක්වෙන ආකාරයේ වූ යම් මුදල්, දේපළ සහ වත්කම්වල වටිනාකම, ස්වභාවය සහ ඒවා පිහිටි ස්ථානය, මණ්ඩලය විසින් බලය දෙන ලද නිලධාරියකුට නිශ්චිත කාල සීමාවක් ඇතුළත අනාවරණය කරන ලෙස එම තැනැත්තාට විධාන කළ හැකි ය :—

(i) එම තැනැත්තාට අයිති යම් මුදල්, දේපළ සහ වත්කම්; හෝ

(ii) එම තැනැත්තාට අර්ථදායී සම්බන්ධතාවයක් ඇති යම් මුදල් දේපළ සහ වත්කම්; හෝ

(iii) එම තැනැත්තා සඳහා භාරයක් වශයෙන් එම තැනැත්තාගේ නෑදෑයකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් අත්කරගත් හෝ මිල දී ගත් හෝ දරනු ලබන හෝ යනුව ඇති හෝ

මුදල් සමාගමේ වත්කම්වලට යොමු කළ හැකි මුදල් වලින් අත්කරගත් හෝ මිලදී ගත් මුදල් දේපළ සහ වත්කම්;

(ආ) කවර වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වේලාවක හෝ එම තැනැත්තාගේ අයිතියේ හෝ භාරයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ ද එසේ සඳහන් කර ඇති එක් එක් දේපළ අත්කර ගත් දිනය සහ එසේ අත්කර ගැනීම සිදුවූයේ, මිලදී ගැනීමෙන්, තෑගි දීමකින්, අන්තිම කැමති පත්‍රයක් මගින් ප්‍රදානයකින්, උරුම වීමෙන් හෝ වෙනත් ආකාරයකින් ද යන වග නිශ්චිත ව සඳහන් කෙරෙන්නා වූ ද ලිඛිත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස, ඒ තැනැත්තාට නියම කළ හැකි ය;

(ඇ) පහත දැක්වෙන පරිදි වූ ලිඛිත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස වෙනත් තැනැත්තකුට නියම කළ හැකි ය;

(i) සපයන තොරතුරු මුදල් සමාගම් කටයුතු පිළිබඳ විමර්ශනයට උපකාරී වෙතැයි විශ්වාස කිරීමට මණ්ඩලයට සාධාරණ හේතු ඇති අවස්ථාවක, යම් වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චිත ව

සඳහන් කරනු ලබන වේලාවක හෝ එම තැනැත්තාගේ අයිතියේ හෝ සන්තකයේ තිබූ සියලු වාටල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන් නාවූ ප්‍රකාශයක් ;

(ii) විමර්ශනයේ දී අදාල වෙතැයි මණ්ඩලය විසින් අද හස් කරනු ලබන වෙනත් කාරණා පිළිබඳ විස්තර අඩංගු ප්‍රකාශයක් ;

(ඇ) එම තැනැත්තාගේ ගිණුමට අදාළ සටහන අඩංගු යම් බැංකුවේ පොතක්, ලේඛනයක් හෝ චෙක්පතක්, දැන් වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතු ළත ඉදිරිපත් කරන ලෙස හෝ එසේ නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි එම සටහන්වල සහතික පිටපත් සප යන ලෙස ශ්‍රී ලංකාවේ යම් බැංකුවක කළමනාකරුට නියම කළ හැකි ය ;

(ඉ) එම තැනැත්තාගේ කටයුතු සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ලබා ගත හැකි සියලු තොර තුරු දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි, සපයන ලෙස ද එම කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ හෝ ඇත්තා වූ ද එම තැනැත්තාට අදාළ වූ ද යම් ලේඛනයක් හෝ එවැනි යම් ලේඛනයක සහතික පිටපතක් දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි සපයන ලෙස ද එම කොමසාරිස් ජනරාල්වරයාට නියම කළ හැකි ය ;

(ඊ) (ආ) ඡේදයේ සඳහන් යම් තොරතුරු මණ්ඩලය විසින් බලය දෙන ලද තැනැත්තකුට සපයන ලෙසට කවර හෝ ක්‍රමයකින් මහජනයාට ආරාධනා කළ හැකි ය ;

(උ) දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දේපළවල හෝ වත්කම් වල සන්තකය, අයිතිය හෝ එහි යම් සම්බන්ධතාවක් (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ එම සඳහන් තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් දේපළ හෝ වත්කම් දරන නෑදෑයකු හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ මුදල් සමාගමක අරමුදල්වලට ආරෝපනය කළ හැකි මුදල්වලින් මිලට ගත් දේපළ හෝ වත්කම් දරන තැනැත්තකු විසින් පැවරීම තහනම් කෙරෙන දැන්වීමක් එම තැනැත්තාට එම තැනැත් තාගේ නෑදෑයාට හෝ වෙනත් තැනැත්තාට භාර දිය හැකි ය. තවද,

(i) මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් එම මෝටර් වාහනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ;

(ii) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන විට එම දේපළ වල හිමිකමට අදාළ ඔප්පුවල ඡායාස්ථිත පිටපත් අමාත්‍යවරයාට භාර දෙන ලෙස එම තැනැත්තාට නියම කෙරෙන දැන්වීමක් එම තැනැත්තාට නිකුත් කළ හැකි ය.

මේ ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්ම දින අනූවක කාලයක් වලංගුව පැවතිය යුතුය ;

(ආ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා මෝටර් වාහන සම්බන්ධයෙන් වූ විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා, යන යම් සමාගමක කොටස් ස්කන්ධ සහ සෑණපත්‍ර සම්බන්ධයෙන් වූ විට සමාගම් රෙජිස්ට්‍රාර් වරයකු, මුදල් සමාගමේ ලේකම්වරයකු ඇතුළු ව යම් අදාළ බලධරයකු වෙත (උ) ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් භාරදිය හැකි ය ;

(එ) (ආ) වන ඡේදයේ සඳහන් දැන්වීමක පිටපතක් භාර දෙනු ලැබූ යම් බලධරයකුට එම දැන්වීම එම බලධරයාගේ භාරයේ ඇති නිසි පොත්වල හෝ ලේඛනවල ලියාපදිංචි කරන ලෙසට නියම කළ හැකි ය ;

(ඒ) (අ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකුගේ හෝ එම තැනැත්තාගේ නෑදෑයකුගේ යම් දේපළ හෝ වත්කම් සම්බන්ධයෙන් (ආ) ඡේදයේ සඳහන් යම් බලධරයකුගේ සන්තකයේ හෝ භාරයේ ඇති යම් තොරතුරක් සපයන ලෙස එම බලධරයාට නියම කළ හැකි ය ;

(ඔ) (i) (උ) ඡේදය යටතේ භාර දෙන ලද දැන්වීමක් වලංගුව පවතින දින අනූවක කාලපරිච්ඡේදය ඉකුත් වීමට පළමුව එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් දේපළක් තහනමට ගැනීමට හා විකිණීමට බලය පැවරෙන ආඥා වක් සහ එම දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා වූ ක්‍රියාවෙහි යෙදවීමේ රිට් ආඥාවක් සඳහා ලඝු කාර්ය පටිපාටිය අනුව වූ ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දේපළ පිහිටි දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(ii) (i) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ පසු ද, ඉල්ලුම් පත්‍රයේ සඳහන් දේපළ හෝ එහි යම් සම්බන්ධතාවක් මුදල් සමාගමකට සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අර්පනය කළ හැකි අරමුදල්වලින් කෙලින්ම වුවද, නොඑසේම වුවද අත්කර ගෙන ඇති බවට එම අධි කරණය සෑහීමට පත් වූ පසුද එම දේපළ තහනමට ගෙන විකිණීමට පිස්කල්ට බලය දෙන සහ නියම කෙරෙන ක්‍රියාවේ යෙදවීමෙහි රිට් බලපත්‍රයක් පිස්කල් වරයාට නිකුත් කිරීමට විධාන කළ හැකි ය.

(iii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන, (ii) වන අනුඡේදය යටතේ නිකුත් කරන ලද ක්‍රියාවෙහි යෙදවීමේ රිට් බලපත්‍රයක් යටතේ යම් දේපළක් තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(iv) මේ ඡේදය යටතේ යම් දේපළක් තහනමට ගෙන විකිණීමෙන් ලබාගත් යම් මුදලක් අධිකරණය විසින්—

(අ) පළමුවෙන්, එම දේපළ තහනමට ගැනීම, තබා ගැනීම හා විකිණීම සඳහා වූ වියදම් හා ගාස්තු ගෙවීම සඳහාද,

(ආ) දෙවනුව, මුදල් සමාගමට ආරෝපණය කළ හැකි බවට අධිකරණය විසින් තීරණය කරන ලද (ii) වන අනුඡේදයේ සඳහන් මුදල පියවීම සඳහාද

යෙදවිය යුතු අතර, ඉතිරිය තහනමට ගත් දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

සම්බන්ධිත කරුණු පිළිබඳව විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.

**26.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල හෝ මුදල් සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ කුමක් සඳහන්ව ඇතද අධ්‍යක්ෂවරයා විසින් සපයා ඇති වාර්තාවක් මත මණ්ඩලය විසින් 18 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ නියමයක් කර ඇති අවස්ථාවක—

(අ) මුදල් සමාගම, මුදල් සමාගමක් සමග හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මුදල් මණ්ඩලය විසින් සලකනු ලබන වැඩ පිළිවෙලක් එම ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව යෙදිය හැකි ය ;

(ආ) එම මුදල් සමාගමේ ප්‍රාග්ධනය වැඩි කිරීමෙන් සහ අලුත් කොටස් හිමියන් බඳවා ගැනීමට වැඩපිළිවෙළ යෙදීමෙන් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංයුක්ත කිරීමෙන් එම මුදල් සමාගම සංවිධානය කළ හැකි ය.

(ඇ) තැන්පත්කරුවන්ගේ යහපත සඳහා වේ යැයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන ආකාරයකට එම මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කළ හැකි ය.

(ඈ) පහත දැක්වෙන පරිදි, එනම්

(i) සමාගමේ කොටස් සඳහා මිල ගණන් කැඳවා ඇති අවස්ථාවක වෙළඳපොළ අගය අනුව ; හෝ

(ii) කොටස් සඳහා එසේ මිල ගණන් කැඳවා නොමැති අවස්ථාවක මණ්ඩලය විසින් නම් කරන ලද ඇගයුම්කරුවකු විසින් තීරණය කරනු ලැබූ මිල අනුව

තීරණය කරනු ලබන වන්දි මුදලක්, මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තකු විසින් ගෙවනු ලැබූ විට තමන්ට අයිති කොටස්වල අයිතිය එම තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස යම් මුදල් සමාගමක යම් කොටස් හිමියකුට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ තමාට දෙන ලද විධානයක් පැහැර හරින කොටස් හිමියකු වරදකට වරදකරු විය යුතු ය.

27. මහ බැංකුව විසින්— රක්ෂණ තැන්පතු.

(අ) 1961 අංක 2 දරන රක්ෂණ පනතේ 10 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් විසින් දරන තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම, ක්‍රියාත්මක කර ගෙන යාම, කළමනාකරණය කිරීම හා පාලනය කිරීම කළ හැකි අතර එම සමාගම් විසින් දරන තැන්පතු යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරන ලෙස නියම කළ හැකි ය; එසේ නැතහොත්

(ආ) මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් විසින් දරන තැන්පතු එවැනි තැන්පතු රක්ෂණය කිරීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කර ඇති ආයතනයක් විසින් පිහිටුවන ලද යම් යෝජනා ක්‍රමයක් යටතේ රක්ෂණය කරන ලෙස එම සමාගම්වලට නියම කළ හැකි ය.

28. (1) 27 වන වගන්තියේ (අ) ඡේදය යටතේ මහ බැංකුව විසින් තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවා ඇති අවස්ථාවක මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති සෑම මුදල් සමාගමක් විසින්ම එම සමාගම් විසින් දරන තැන්පතු මේ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරන ලෙස මහ බැංකුව වෙත ඉල්ලුම් කළ යුතු ය. තැන්පතු රක්ෂණය කිරීම සඳහා මහ බැංකුව වෙත ඉල්ලුම් කළ යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් මහ බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි අතර, එවැනි ඉල්ලීමක් මහ බැංකුව විසින් පිළිගත් අවස්ථාවක අදාළ අවදානම් ගැන සැලකිල්ල දක්වා මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වාර මුදලක් එම රක්ෂණය සඳහා මහ බැංකුව වෙත ගෙවන ලෙස ඉල්ලුම්කාර මුදල් සමාගමට නියම කළ හැකි ය.

(3) මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාල පරිච්ඡේද සඳහා ද, එසේ තීරණය කරනු ලබන කාලවල දී ද, එසේ තීරණය කරනු ලබන ආකාරයට ද එම වාර මුදල ගෙවිය යුතු ය.

(4) රක්ෂිත මුදල් සමාගමක් යම් වාර මුදලක් ගෙවීම පැහැර හැරියහොත් එම පැහැර හැරීමේ හේතුව නිසා මණ්ඩලයට සිදුවීමට ඉඩ ඇති පාඩු සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයක් අනුව එම වාර මුදලේ මුදල් ප්‍රමාණය මත එම පැහැර හැරීමේ කාලපරිච්ඡේදය සඳහා පොලිය මහ බැංකුවට ගෙවීමට එම මුදල් සමාගම යටත් විය යුතු ය.

තැන්පතු රක්ෂණයට අදාළ රීති.

**29.** මණ්ඩලය විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සෑදිය හැකිය :—

(අ) රක්ෂිත මුදල් සමාගමක් විසින් වාර මුදල් ගෙවීම පැහැරහල අවස්ථාවක එම මුදල් සමාගමෙන් අය කළ හැකි පොළිය ;

(ආ) මුදල් සමාගම්වල තැන්පතු රක්ෂණය කිරීමේ කාර්යය සඳහා මේ පනත යටතේ නියම කළ යුතු බවට ප්‍රකාශිත හෝ නියමිත කාරණයක් හෝ රීති සෑදීමට බලය ලත් කාරණයක් ;

(ඇ) මේ පනතේ 27 සහ 28 වන වගන්ති යටතේ මහ බැංකුවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කෙරෙහි බලපාන, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් කාරණයක්.

පනතේ විධිවිධාන ඇතැම් ආයතනවලට අදාළ නොවන බව.

**30.** මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද මේ පනතේ විධිවිධාන (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ යම් බැංකු ආයතනයක වෙළඳ ව්‍යාපාරයට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියකට හෝ 1979 අංක 2 දරන ජාතික සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුවේ ව්‍යාපාරයට හෝ (165 වන අධිකාරය වන) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාවට හෝ අදාළ නොවිය යුතු ය.

අක්‍රිය තැන්පතු මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කිරීම.

**31.** (1) යම් මුදල් සමාගමකට ඇති තැන්පතුවක් අක්‍රිය බවට පත්ව ඇති අවස්ථාවක, එනම්, කල් පිරීමෙන් පසු අවුරුදු දහයක කාලයක් තුළ, කල් පිරී ඇති තැන්පතුව ආපසු ගැනීම සඳහා තැන්පත්කරු නොපැමිණි අවස්ථාවක හෝ අවුරුදු දහයකට අධික කාලයක් තුළ තැන්පතුවට අදාළව, තැන්පත්කරුගෙන් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ යම් ලියවිල්ලක් මුදල් සමාගමට නොලැබ තිබූ අවස්ථාවක, එසේ තැන්පත්ව තිබෙන මුදල්, ඊට උපචිත පොලියක් වෙතොත් එය ද සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කරන ලෙස මණ්ඩලය විධාන කළහොත් ඒ ආයතනය විසින්, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වී තිබුන ද, එසේ මාරු කළ යුතු ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුදල් සමාගමක තමාගේ බැරට, තමාගේ නමින් හෝ තමාට හිමිකම් ව්‍යුත්පන්න වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නමින් හෝ ඇති යම් මුදලක් (1) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ

විශේෂ ගිණුමකට මාරු කර ඇති බව මණ්ඩලය සෑහීමට පත්වන අයුරු ඔප්පු කරන යම් තැනැත්තකු, යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ ඒ මුදල් සම්බන්ධයෙන් පනවා ඇති නියමයන්ට කොන්දේසිවලට හෝ සීමා කිරීම්වලට යටත්ව ඒ මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව ඒ මුදල ආපසු ගෙවනු ලැබූ දිනය දක්වා වූ පොලියත් සමග හෝ පොලිය නොගෙවන ලෙස මණ්ඩලය තීරණය කළහොත් ඒ පොලිය රහිතව මහ බැංකුව විසින් ආපසු ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විශේෂ ගිණුමකට මාරු කරනු ලැබූ යම් මුදලක්, මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගෙන් විමසීමෙන් පසු මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාර්ය යක් සඳහා ප්‍රයෝජනයට ගත හැකි ය.

32. (1) යම් තැනැත්තකු—

(අ) යම් අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් වූවකු ඹවට ප්‍රකාශ කර ඇත් නම්;

(ආ) චරිත දූෂණය සම්බන්ධයෙන් වූ වරදක් සඳහා යම් අධිකරණ යක් විසින් වරදකරු කරනු ලැබ ඇත් නම්;

(ඇ) මේ පනත යටතේ හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වූ යම් වරදක් සඳහා වරදකරු කරනු ලැබ ඇත් නම්;

(ඈ) මේ පනතේ 18 වන හෝ 25 වන වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් තමාට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇති තැනැත්තකු නම්

ඒ තැනැත්තා මුදල් සමාගමක, අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක යකු හෝ ලේකම්වරයකු ලෙස, අවස්ථෝචිත පරිදි පත් කිරීමට හෝ තෝරා පත් කර ගැනීමට නැතහොත් එවැනි ධුරයක් දැරීමට නුසුදුස්සකු විය යුතු ය.

මුදල් සමාගම්වල ඇතැම් ධුර දැරීම සඳහා නුසුදුසුකම්.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් නුසුදුසුකමක් යටතේ සිටින කාලය තුළ මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ලේකම්වරයකු ලෙස ක්‍රියා කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතු ය.

33. (1) මණ්ඩලය විසින් මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙනු ලැබ ඇති හෝ සඳහන් කරනු ලැබ හෝ නියම කරනු ලැබ ඇති යම් කරුණක් ගැන රීති සාදනු ලැබිය හැකි ය.

රීති.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්ති යට හානියක් නොවන පරිදි, මණ්ඩලය විසින් විශේෂයෙන්ම, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් වෙනුවෙන් රීති සාදනු ලැබිය හැකිය :—

(අ) මුදල් සමාගම් ලියාපදිංචි කිරීම සහ මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා මුදල් සමාගම් විසින් මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු;

(ආ) මේ පනත යටතේ භාවිතයට ගත යුතු ආකෘති;

(ඈ) මහජනයාගෙන් තැන්පත් මුදල් ඉල්ලා සිටිමින් යම් ප්‍රකාශ පත්‍රයක් හෝ වෙළඳ දැන්වීමක් යම් තැනැත්තකු විසින් හෝ තැන්පත් මණ්ඩලයක් විසින් නිකුත් කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ එවැනි ප්‍රකාශ පත්‍රයක් හෝ වෙළඳ දැන්වීමක් නිකුත් කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි.

විධාන.

34. මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ ලිඛිත විශේෂ විධාන මණ්ඩලය වෙත දිය හැකි අතර, ඒ විධාන මණ්ඩලය විසින් බලාත්මක කළ යුතු ය.

වරදවල්.

35. (1) මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු හෝ විගණකවරයකු වන යම් තැනැත්තකු විසින්—

(අ) මේ පනතේ නියමයන් මුදල් සමාගම විසින් ඉටුකිරීම සුරක්ෂිත කිරීම පිණිස සියලු සාධාරණ පියවර නොගත හොත් ;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයක් ඉටු කිරීම පැහැර හැරියහොත් ;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක නිරවද්‍යතාව සුරක්ෂිත කිරීමට සියලු සාධාරණ පියවර නොගතහොත් ;

(ඈ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයේ, කටයුතුවල, ගණුදෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක, කඩදාසි කෑබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශයක වුවමනාවෙන්ම වැරදි සටහනක් කළහොත් හෝ එවැනි සටහනක් කිරීමට සැලැස්වුවහොත් නැතහොත් එවැනි සටහනක් කිරීම වුවමනාවෙන්ම අත්හැර දැමීමට සැලැස්වුවහොත් ;

(ඉ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයට අදාළ කටයුතුවල, ගණුදෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක, කඩදාසි කෑබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශයක වුවමනාවෙන්ම සටහනක් කිරීම අත්හැරිය හොත් හෝ එවැනි යම් සටහනක් අත්හැරීමට සැලැස්වුවහොත් ; හෝ

(ඊ) යම් පොතක හෝ ලේඛනයක හෝ ඒ මුදල් සමාගමේ ව්‍යාපාරයේ, කටයුතුවල, ගණුදෙනුවල, කොන්දේසිවල, වත්කම්වල හෝ බැරකම්වල හෝ ගිණුම්වල යම් වාර්තාවක කඩදාසි කෑබෙල්ලක, ලේඛනයක හෝ ප්‍රකාශ

යක වූ යම් සටහනක් වුවමනාවෙන්ම වෙනස් කළහොත්, වෙන් කළ හොත්, සැඟවූවහොත් හෝ විනාශ කළහොත් එවැනි යම් සටහනක් වුවමනාවෙන්ම වෙනස් කිරීමට, වෙන් කිරීමට, සැඟවීමට හෝ විනාශ කිරීමට සැලැස්වුව හොත්

ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකුට විරුද්ධව කරන ලද යම් නඩුවකදී, මේ පනතේ නියමයන් ඉටු කිරීම සුරක්ෂිත කිරීමේ කාර්යය හෝ ප්‍රශ්නයට අදාළ ප්‍රකාශ නිවැරදි බවට සහතික වීමේ කාර්යය වෙනත් තැනැත්තකු විසින් ඉටු කරන බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු, තිබෙන බවත් සහ ඒ තැනැත්තා ඒ කාර්යය ඉටු කිරීමට නිසි බලය ඇතිව සහ තත්ත්වයක සිටින බවත් ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

36. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ දෙන ලද යම් රීතියක්, විධානයක් හෝ නියමයකට පටහැනි වන්නා වූ හෝ එය ඉටු කිරීම පැහැර හරින්නා වූ හෝ මේ පනතේ යම් විධානයක් යටතේ තොරතුරු සපයන ලෙස නියම කළ විට අසත්‍ය තොරතුරු සපයන්නා වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් මණ්ඩලයක් මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. පුද්ගල මණ්ඩලයක් විසින් කරන වරදවල්.

(2) තැනැත්තන් මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් කර ඇති විට—

(අ) තැනැත්තන් මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම ; සහ

(ආ) තැනැත්තන් මණ්ඩලය සංස්ථාගත නොකළ මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකුම

ඒ වරදට වරදකරු වන්නේ ය :

එසේ වුව ද, වරද සිදු කර ඇත්තේ තමාගේ දැනුවත්කමක් නොමැතිව බව ද ඒ වරද සිදු කිරීම වළක්වා ලීමට තමා විසින් සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ද ඔප්පු කළ හොත් එවැනි තැනැත්තකු වරදකට වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

37. 2 වන වගන්තියේ විධිවිධානවලට පටහැනිව යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් මණ්ඩලයක් විසින් මුදල් ව්‍යාපාර කරගෙන යනු ලබන අවස්ථාවක ඒ පටහැනි වීම සම්බන්ධයෙන් මේ පනතේ වෙනත් යම් වගන්තියක විධිවිධාන යටතේ යම් ක්‍රියා මාර්ගයක් ගනු ලැබ හෝ ගැනීමට ඇත්තේ වී නමුදු මහජන සුභ සිද්ධිය අරභයා මුදල් මණ්ඩලය විසින් කවර හෝ මාර්ගයකින්— පනත උල්ලංඝනය කරන තැනැත්තන්ගේ නම් ප්‍රකාශයට පත් කිරීම.

(අ) සමාගමක් හෝ සංස්ථාගත කරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථෝචිත පරිදි ඒ සමාගමේ නම ද එහි අධ්‍යක්ෂවරයන්ගේ නම් ද ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ නම ද ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ගේ නම් ද;

(ආ) තැනැත්තෙක් හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තන් මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් ද

ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

දණ්ඩන.

38. මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්ත කුම මහෙස්ත්‍රාත් අධිකරණයක් හමුවේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනකට වැඩි නොවූ කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් එක් මිලියනයකට වැඩි නොවූ දඩයකට හෝ යටත් විය යුතු ය.

මහ බැංකුවේ නිලධරයා රජයේ නිලධරයකු වන බව.

39. මේ පනත යටතේ වරදවල් වෙනුවෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා මහ බැංකුවේ නිලධරයන්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ අර්ථය ඇතුළත රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

වරදවල් සමථයකට පත් කිරීම.

40. (1) මේ පනත යටතේ වරදක් කිරීමට යෙදුණු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින් මණ්ඩලයේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂවරයා විසින්, ඒ වරද රුපියල් එක් ලක්ෂයකට සමාන මුදලක් සඳහා සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ යම් වරදක් සමථයකට පත් කිරීම—

(අ) පාර්ශ්වකරුවන් දෙදෙනාගේ ම අත්සන යටතේ, වරද සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අධිකරණය වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය;

(ආ) චූදිතයා නිදොස් කිරීමක් ලෙසින් බල සහිත විය යුතු ය.

මුදල් සමාගම්වල බලපත්‍ර අවලංගු කිරීම.

41. (1) යම් මුදල් සමාගමක්—

(අ) බලපත්‍රය නිකුත් කිරීමෙන් පසු මාස නවයක් ඇතුළත ව්‍යාපාරය ආරම්භ කිරීමට නොයෙදුනහොත්; හෝ

(ආ) එය විසින් දරන ලද යම් ණයක් ඒ ණය ගෙවිය යුතු වූ විට නොගෙවා සිටියහොත් ; හෝ

(ඇ) ඊට විරුද්ධ ව, සහන සඳහා පෙත්සමක් හෝ නඩුවක් පවරන ලදුව, යම් වස්තු භංගත්ව නීතියක් හෝ සහන සඳහා හෝ ණය කරුවන් සඳහා සහන සඳහා ඉඩ සලස්වා ඇති හෝ ණයකරුවනට අදාළ වන්නාවූ යම් නීතියක් යටතේ ඒ සමාගම වෙනුවෙන් ආරක්ෂකවරණකරුවකු හෝ දේපළ භාරගන්නකු පත් කරනු ලැබ ඇති අවස්ථාවක ; හෝ

(ඈ) එය විසින් මුදල් ව්‍යාපාර කරගෙන යාම අවසන් කරනු ලැබුවහොත් ; හෝ

(ඉ) පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද විධාන දිගටම උල්ලංඝනය කරනහොත් හෝ ඒවාට පටහැනි වෙතොත් ; හෝ

(ඊ) වාර්ෂික බලපත්‍ර ගාස්තුව නොගෙවුවහොත්

ඒ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට යෙදෙන බවට මණ්ඩලය විසින් දැන්වීමක් කරනු ලැබිය හැකි අතර ඒ දැන්වීම බලපත්‍රලත් මුදල් සමාගමට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) 7 වන වගන්තිය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද බලපත්‍රය එලෙස අවලංගු කරනු නොලැබිය යුත්තේ කුමක් නිසාද යන බවට හේතු සඳහන් කරමින්, (1) වන උප වගන්තිය යටතේ වූ අවලංගු කිරීමේ දැන්වීමකට විරුද්ධව, ඒ දැන්වීම ලැබුනු දිනයේ සිට දින තිහක් ඇතුළත, ඒ මුදල් සමාගම විසින් මණ්ඩලය වෙත ලියවිල්ලකින් වූ විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අවලංගු කිරීම පිළිබඳ නිවේදනයේ දිනයේ සිට දින හැටක් ඉකුත්වීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු මණ්ඩලය විසින් ඒ දැන්වීම ඉල්ලා අස්කර ගැනීම හෝ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි අතර, ඒ අනුව මුදල් සමාගමට දන්වා සිටිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමක්—

(අ) අවලංගු කිරීමට විරුද්ධව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම සඳහා වූ කාලය අවසන් වීමෙන් පසු, එවැනි ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කර නැති අවස්ථාවක ; හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවලංගු කිරීම ස්ථිර කිරීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක බලාත්මක විය යුතු අතර,

ඒ අවලංගු කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(5) මුදල් සමාගමක බලපත්‍රය එලෙස අවලංගු කරන ලද අවස්ථා මණ්ඩලය විසින් 6 වන වගන්තිය යටතේ පවත්වාගෙන යන ලේඛනයෙන් මුදල් සමාගමේ නම ඉවත් කළ යුතු අතර, ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ද ඇතුළු, මණ්ඩලය අවශ්‍ය යයි සලකන විධාන මණ්ඩලය විසින් නිකුත් කිරීම හෝ ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන ලෙස අධ්‍යක්ෂ වරයාට නියම කිරීම කරනු ලැබිය හැකි ය. එවැනි කරුණක දී 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) නිකුත් කිරීමෙන් දින තිහක් ඇතුළත (5) වන උපවගන්තියේ විධිවිධාන ඉටුකිරීමට මුදල් සමාගමට නොහැකි වින අවස්ථාවක, මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා හැඩි අවිරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයකු නියම කරනු ලැබිය හැකි අතර, එසේ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 18 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

බලය පැවරීම.

**42.** තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි රීති ඇත්නම්, ඒ රීතිවලට යටත්ව හා ඒවාට අනුකූලව, මේ පනතේ යම් කාර්යයක් සඳහා මණ්ඩලය නියෝජනය කිරීම පිණිස වූ එහි අධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකුට මණ්ඩලය විසින් ලියවිල්ලකින් පවරා දෙනු ලැබිය හැකි වුවද, ඒ නිලධරයා විසින් කරනු ලද හෝ නොකර අත්හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා වගකීම මණ්ඩලය වෙත රැඳී තිබිය යුතු අතර එසේ දිගටම රැඳී පැවතිය යුතු ය.

ඇතැම් නියමයන්ට අදාළ නඩු කටයුතු.

43. (1) 2 වන වගන්තිය හෝ 10(2) වන වගන්තිය හෝ 11(2) වන වගන්තිය හෝ 18(4) වන වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 26 වන වගන්තිය හෝ 40 වන වගන්තිය යටතේ කරන ලද්දා වූ හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද්දා වූ නියමයකින් අනාප්තියට පත් වූ කිසිදු තැනැත්තකුට හෝ ඒ වගන්තිවලින් යම් වගන්තියක් යටතේ හෝ ඒ යටතේ යයි අදහස් කරමින් ගන්නා ලද හෝ ගැනීමට යෝජනා කරන්නා වූ හෝ යම් ක්‍රියාවකින් හෝ පියවරකින් තමාට බලපෑමක් ඇති වේ යයි සැක කරන්නා වූ තැනැත්තකුට, ඉංජන්ෂන් තහනමකට, වාරණ නියෝගයකට නැවැත්වීමේ ආඥාවකට හෝ මණ්ඩලය විසින් ඒ නියමය බලාත්මක කිරීමෙන් මණ්ඩලය නවත්වාලීමේ, වළක්වාලීමේ හෝ අවහිර කිරීමේ බලපෑම් ඇති වෙනත් යම් ආඥාවකට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය, 2 වන වගන්තිය හෝ 10 (2) වන වගන්තිය හෝ 11 (2) වන වගන්තිය හෝ 18 (4) (අ) වන වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 24 වන වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 26 වන වගන්තිය හෝ 40 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ආඥාවකට අදාළව, අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කරන ලද අධිකරණ බලය අයැද සිටින සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම වෙනුවෙන් හෝ ඒ ඉල්ලීමට අදාළ වූ හෝ ක්‍රියාව සිදුකිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම ගොනු කිරීමෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

(2) (1) වන උප වගන්තියෙහි ඇතුළත් වන කිසිවකින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිත්‍යානුකූලව අන්‍යාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ (3) වන උප වගන්තියේ සඳහන් කරන ලද අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී බලපෑමක් සිදු නොවිය යුතු ය.

(4) මේ වගන්තියෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, මණ්ඩලයට විරුද්ධව යම් අතුරු ආඥාවක් හෝ අවසාන ආඥාවක් කිරීමට ප්‍රථම, මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතු ය.

නඩුවලින් ආරක්ෂාව.

44. මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද්දා වූ හෝ කරන ලදැයි අදහස් කරන්නා වූ හෝ යම් ක්‍රියාවක් සඳහා මුදල් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

ඉවත් කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන.

45. (1) 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය පනත ඉවත් කරනු ලැබුවේ වුව ද, ඉවත් කරන ලද පනත යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්, නියමයක් රීතියක් හෝ විධානයක්, පනවන ලද නියමයක්, රීතියක් හෝ කරන ලද බලය පැවරීමක් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පැවතියේ නම් සහ ඒ දැන්වීම, නියමය, විධානය, නියම කිරීම, රීතිය හෝ බලය පැවරීම මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ ඒ හා සමාන විධිවිධාන යටතේ නිකුත් කරන ලද, පනවන ලද හෝ සාදන ලද දැන්වීමක්, නියමයක්, විධානයක්, නියම කිරීමක්, රීතියක් හෝ බලය පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද මුදල් සමාගම් පාලනය කිරීමේ නියෝග සමග කියවිය යුතු 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත යටතේ 1988 ජූනි 16 වන දිනෙන් ආරම්භ ව, මේ පනත ආරම්භ වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ දී ගන්නා ලද යම් ක්‍රියාවක්, කරන ලද නියමයක් හෝ දෙන ලද විධානයක්, එම නියෝග සෑදීමට මහජන ආරක්ෂක ආඥාපනතින් බලය දෙනු ලැබ ඇති පරිද්දෙන් වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය.

(4) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද මුදල් සමාගම් පාලනය කිරීමේ නියෝග සමග කියවිය යුතු 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනතේ විධිවිධාන ප්‍රකාර හෝ එසේ යයි අදහස් කරන ප්‍රකාර, 1988 ජූනි මස 16 වන දිනෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනෙන් අවසන් වන කාලසීමාව තුළ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සඳහා හෝ නොකර

හැරී යම් ක්‍රියාවන් සඳහා මණ්ඩලයට හෝ මණ්ඩලයේ යම් නිල ධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ බලධරයකුට විරුද්ධව රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාර සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ පවත්වා ගෙන යාම හෝ අඛණ්ඩව කරගෙන යාම නොකළ යුතු ය.

අර්ථ නිරූපණය.

**46.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"ප්‍රාග්ධනය" යන්නෙන්, යම් සමාගමක ගෙවා නිමි ප්‍රාග්ධනය අදහස් වේ;

"ප්‍රාග්ධන අරමුදල්" යන්නෙන්, ගෙවා නිමි අරමුදල් සහ ස්ථිර නිදහස් සංචිත අදහස් වන අතර, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලබන්නේ නම්, අනාරක්ෂිත ණයපත්‍රවල සහ වෙනත් ණය බැඳුම්කරවල මුණත වටිනාකම ඇතුළත් වේ; ඒ වටිනාකම, මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම හෝ ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ අඩු කිරීම සිදුවන අවස්ථාවක, තැන්පතුවලට සහ මුදල් සමාගමේ වෙනත් ණයහිමියන්ට පසු ස්ථානය ගත යුතු අතර ඒවාට පහළ ස්ථානයක විය යුතු ය;

"වාණිජ බැංකුව" යන්නට (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, මුදල් සමාගම් විෂයය පවරනු ලැබ ඇති මහ බැංකුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ;

"මුදල් ව්‍යාපාර" යන්නෙන් තැන්පතු මාර්ගයෙන් මුදල් භාර ගැනීම, ඒ මත පොලී ගෙවීම සහ—

(අ) පොලියට මුදල් ණයට දීම; හෝ

(ආ) යම් කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීම; හෝ

(ඇ) පොලියට මුදල් ණයට දීම සහ යම් කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීම

අදහස් වේ;

"මුදල් සමාගම" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනතේ විග්‍රහ කර ඇති පරිදි වූ ද මුදල් ව්‍යාපාර කරගෙන යාම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද සමාගමක් අදහස් වේ;

"කුලී ගෙවා මිලට ගැනීමේ ගිවිසුම" යන්නෙන්, (ගිවිසුමෙන්, බද්ද, වාරිකය, කුලිය වශයෙන් විස්තර කරන්නේ සතිපතා, දෙසතිහෝ මාසික ගෙවීම් වුව ද අන්‍යාකාර වුව ද) මිලට ගැනීමට ඇති මනාපය සමඟ බඩු කුලියට දීම සඳහා වූ ගිවිසුමක් අදහස් වන නමුත් ඒ

ගිවිසුමෙන්, එහි අන්තර්ගත වූ බඩුවල දේපළ ගිවිසුමේ වේලාවේදී හෝ ඒ මත හෝ බඩු භාර දීමට ප්‍රථම කවර හෝ වේලාවක දී නිකුත් කරනු ලබන්නා වූ යම් ගිවිසුමක් ද ඊට ඇතුළත් නොවිය යුතු ය;

"කුලියට ගන්නා" යන්නෙන්, බඩු බද්දට ගනු ලබන, කුලියට ගනු ලබන හෝ කුලිය ගෙවා මිලට ගැනීමේ ගිවිසුමක් යටතේ විකිණීම ලැබීමට එකඟ වී සිටින තැනැත්තකු අදහස් වන අතර, එවැනි ගිවිසුමක් යටතේ වූ කුලියට ගන්නාගේ අයිතිවාසිකම් හෝ බැදීම්, පැවරීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් ලබාගන්නා වූ තැනැත්තකු ඇතුළත් වේ;

"පාලක සමාගම" හා "පාලිත සමාගම" යන්නට 1982 අංක 17 දරන සමාගම් පනතේ 150 වන වගන්තියේ ඒවාට දී ඇති අර්ථයම තිබිය යුතුය;

"ද්‍රවශීල වත්කම්" යන්නෙන්—

(අ) අත ඇති මුදල්;

(ආ) යම් බැංකුකරුවකුගේ ලියමෙන් හෝ අය කිරීමෙන් නිදහස්, වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක හෝ තැන්පත් ගිණුමක ශේෂ;

(ඇ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් ශ්‍රී ලංකාණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්;

(ඈ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් එක් අවුරුද්දක් තුළ කල් පිරෙන ශ්‍රී ලංකාණ්ඩුවේ සුරැකුම්පත්;

(ඉ) යම් අයකිරීමකින් හෝ ලියමකින් නිදහස් එක් අවුරුද්දක් තුළ කල් පිරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්;

(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්වාගෙන යන මුදල් ශේෂ ඇත්නම් එකී මුදල් ශේෂ;

"ණය" යන්නට යම් අත්තිකාරමක් හෝ යම් විකිණීමක දී ගෙවීම කල් දැමීම හෝ කුලිය ගෙවා මිලට ගැනීමේ ගිවිසුමකට අදාළ ගණුදෙනුවක දී ගෙවීම කල් දැමීම හෝ යම් බද්දට ගැනීමේ ගණුදෙනුවක දී ගෙවීම් ගිවිසුම් ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද රීති වලින් නියමිත බව අදහස් වේ;

"නෑදෑයා" යන්න පුද්ගලයකුට අදාළ වන විට ඒ පුද්ගලයාගේ භාර්යාව, ස්වාමිපුරුෂයා හෝ යැපෙන දරුවකු අදහස් වේ;

"හරවත් සම්බන්ධතා" යන්නෙන්—

(i) සමාගමකට අදාළ කිරීමේ දී, වෙනත් සමාගමක් විසින් හෝ තැනැත්තකු විසින් හෝ ඔහුගේ ආසන්න නෑදෑයකු විසින්, තනි තනිව හෝ එක්ව ගත් විට එහි කොටස්වල ගෙවූ නිමි වටිනාකම රුපියල් එක් මිලියනයක් හෝ සමාගමේ ගෙවූ නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් යන දෙකෙන් වැඩි ප්‍රමාණයක අර්ථලාභී සම්බන්ධතාවක් දැරීම හෝ ඒ සමාගම

වෙනුවෙන් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ නෑදෑයා විසින් හෝ වෙනත් සමාගම විසින් දෙන ලද ඇපයක් හෝ හානි පූරණයක් පැවතීම අදහස් වේ ;

(ii) ව්‍යාපාර ආයතනයකට අදාළ කිරීමේ දී, පුද්ගලයකු විසින් හෝ ඔහුගේ නෑදෑයා විසින් තනි තනිව හෝ එක්ව ගත් විට ඒ ව්‍යාපාර ආයතනයේ සියලු ම හවුල්කරුවන් විසින් දායක වී ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයකට දහයකට වැඩි ප්‍රමාණයක් නියෝජනය වන අයුරු එහි ප්‍රාග්ධනයෙහි අර්ථලාභී සම්බන්ධතාවක් දැරීම හෝ ඒ ව්‍යාපාර ආයතනය වෙනුවෙන් පුද්ගලයකු විසින් හෝ ඔහුගේ හෝ ඇගේ භාර්යාව/ස්වාමිපුරුෂයා විසින් හෝ දෙමාපියකු විසින් හෝ දරුවකු විසින් දෙන ලද ඇපයක් හෝ හානි පූරණයක් තිබීම අදහස් වේ ;

“ අඩු නොකළ ප්‍රාග්ධනය ” යන්නෙන් ලියමක් හෝ වෙනත් අයකිරීමක් නොමැති ප්‍රාග්ධනය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.